**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ</u>**

**<u>සීමිත තරග විභාගය - 2017</u>**

උක්ත තරග විභාගයට අදාල 2019.07.18 දිනැතිව වෙබ් අඩවියේ පළ කරන ලද නිවේදනය හා බැඳේ.

02. ඒ අනුව, එහි පළ කරන ලද නාම ලේඛනයේ සඳහන් නිලධාරීන් සඳහා වන සේවාරම්භක පුහුණුව 2019.08.19 වන දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දී ආරම්භ කිරීමට කටයුතු සලසා ඇත. මේ සම්බන්ධව දැනටමත් ආයතන ප්‍රධානීන් මගින් නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

03. සේවාරම්භක පුහුණුවේ ආරම්භක සැසි අවසානයේ 2019.08.20 වන දින නිලධාරීන් නව සේවා ස්ථානවලට අනුයුක්ත කරනු ලැබේ. සේවාරම්භක පුහුණුවේ ඉදිරි කාලසටහන සම්බන්ධයෙන් ආරම්භක සැසිවලදී නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව අදාල ආයතන ප්‍රධානීන් මෙම නිලධාරීන් දැනට සිටින සේවා ස්ථානවලින් මුදාහැර සේවාරම්භක පුහුණුව වෙත යොමු කිරීමට කටයුතු කරන්නේ නම් මැනවි.

කේ.වී.පී.එම්.ජේ. ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට